<u>**පටිච්චසමුප්පාදය (නමවෙනි කොටස)**</u>
<u>20.07.2019 - ශ්‍රී ලංකාරාමය</u>
<u>නවසීලන්තය</u>

හොඳයි අද මේ පින්වතුන්ට ධර්ම කරුණු ටිකක් කියලා දෙනවා මේ පටිච්චසමුප්පාදයට සම්බන්ධ. පටිච්චසමුප්පාදය අති ගාම්භීරයි. බොහෝම ගැඹුරුයි. ඒක සමාන්‍යයෙන් පොඩි දෙයක් කියලා හිතන්නත් හොඳ නෑ. නමුත් ඒ ගාම්භීර වූ ධර්මය අමාරුවෙන් හරි තේරුම් ගත්තොත් තමයි ඒකෙ අසාරය නිස්සාරය දැනගෙන අපිට ඒකෙන් අයින්වෙන්න පුළුවන් කම තිබෙන්නේ. ඕක නොතේරුනොත් අයින්වෙන්න අමාරුයි.

**නාමරූප පච්චයා සළායතනං** කියලා කිව්වා. අපි ඒක අද පොඩ්ඩක් මේ විදියට දැන ගනිමු. මම මේ කියලා දෙන ටික සෑම දෙනාටම ඉතාමත් හොඳින් වැටහේවා! තේරේවා! අවබෝධ වේවා! හොඳින් තේරුම් ගන්න ලැබේවා! මෙය ධර්ම මනසිකාරයක් නිවනට මාර්ගයක් ප්‍රත්‍යය වීමක් ප්‍රතිපදාවක් වේවා! මේ ධර්ම තේරුම් ගැනීමෙන් ඇසීමෙන් හිතීමෙන් මෙනෙහි කිරීමෙන් පරම ගාම්භීර වූ නිර්වාණ ධාතුවම සුවසේ අවබෝධ වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**නාම රූප පච්චයා සළායතනං** කියන එක අපි මේ විදියට දැනගනිමු. ඊළඟ එකට යන්න ඉස්සෙල්ලා මේ ටික හොඳට තේරුම් ගනිමු.

<u>**නාම රූප පච්චයා සළායතනං**</u>

**නාම** කියන්නේ මොකක්ද? **නාම = වේදනා - සංඥා - සංඛාර.**

රූප කියලා කියන්නේ විපාක වශයෙන් ඇතිවෙන රූප = **ආයතන රූප.**

මේ **නාම රූප** නිසා හැදෙනවා ආයතන හයක්. මේ ආයතන හයට තමයි සළායතන කියලා කියන්නේ. මේ සළායතන කියලා කියනතැන එකට ගුලිකරලා එකට කාණ්ඩ කරලා එක pack එකකට තිබෙන්නේ. ඒකනිසා අපි ඒක පහත සඳහන් අයුරින් තේරුම් ගන්න ඕනෑ.

**නාම රූප** පච්චයා චක්ඛායතනං
**නාම රූප** පච්චයා සෝතායතනං
**නාම රූප** පච්චයා ඝාණායතනං
**නාම රූප** පච්චයා ජිව්හායතනං
**නාම රූප** පච්චයා කායාතනං
**නාම රූප** පච්චයා මානායතනං

} මේ ටිකට තමයි කියන්නේ **'සළායතනං'** කියලා.

**නාම රූප පච්චයා සළායතනං** කියලා කිව්වහම මේ ගැන දන්නේ නැති, හරියට විග්‍රහ කරලා බෙදා ගන්න බැරි ප්‍රාථමික අවධියක ඉන්න පුංචි ලාබාල හිතකට තේරෙන්නේ නාම රූප නිසා මේ ආයතන හයම එකම වෙලාවේ පහළ වෙනවා කියලා. එතකොට තර්කයකුත් කරන්න පුළුවන් 'අපි කනවා බොනවා රූප බලනවා අහනවා හිතනවා වේදනාවකුත් විඳිනවා, මේ ඔක්කෝම එකම වෙලාවක කරනවා' කියලා කෙනෙකුට වැටහීමක් ඇතිවෙන්න පුළුවන්. අපි ඒක එහෙම නොවෙයි කියලා කිව්වොත් එහෙම එයාට කෙලින්ම පොතෙන් පෙන්නන්න පුළුවන් පොතේ තිබෙන්නෙත් **නාම රූප පච්චයා සළායතනං** කියලා නේද කියලා. මේකට කියනවා සාමූහිකව කරන්නා වූ දේශනය කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ **නාම රූප පච්චයා සළායතනං** කියලා දේශනා කරලා එතැනින් නැවත්වූයේ නෑ.

**පටිච්චසමුප්පාද විභංගය** කියලා එකක් තිබෙනවා. **පටිච්චසමුප්පාද විභංගය** කියලා කියන්නේ **නාම රූප පච්චයා සළායතනං** කියලා කියපු මාතෘකාව පුංචියට පුංචියට කඩනවා. එහෙම කඩලා පෙන්නුම් කරන එකට කියනවා විභජනය කරනවා විභංග කරනවා කියලා. විභජනය කළාට පස්සේ **නාම රූප පච්චයා චක්ඛායතනං - නාම රූප පච්චයා සෝතායතනං - නාම රූප පච්චයා ඝාණායතනං - නාම රූප පච්චයා ජිව්හායතනං - නාම රූප පච්චයා කායායතනං - නාම රූප පච්චයා මනායතනං** කියලා තමයි එන්නේ.


අපි ගිය පාර කිව්වා ආයතන වශයෙන් හැදෙන්නේ කොහොමද කියලා. මේ විදියට සළායතනය කියන එක හයකට බෙදුවහම අද අපිට තිබෙන ප්‍රශ්නය තමයි ඕක කොහොමද ස්පර්ශ වෙන්නේ කියලා. හේතුව, **නාමරූප**

**පච්චයා සළායතනං - සළායතන පච්චයා ඵස්සො** කියලා තමයි කියන්නේ. **සළායතන පච්චයා ඵස්සො** කියලා කිව්ව ගමන්ම ආයතන හය නිසාම **‘සපර්ශය’** වෙනවා.


නමුත් ඒකෙ වෙන්න ඕනෑ වෙන්නේ **චක්ඛායතන පච්චයා ඵස්සො - සෝතායතන පච්චයා ඵස්සො - ඝාණායතන පච්චයා ඵස්සො - ජිව්හායතන පච්චයා ඵස්සො - කායායතන පච්චයා ඵස්සො - මනායතන පච්චයා ඵස්සො කියලා.**

මේ විදියට වෙන් වෙන් වශයෙන් ගත්තට පස්සේ තමයි ස්පර්ශය කියන එක තේරෙන්නේ. මේ ටික ඔක්කොම එකට අරගෙන විග්‍රහ මනස දාල බලන්න ගියහම හිත තැන් තැන්වල හිරවෙනවා. අවබෝධයට බාධාවක් වෙනවා. ඒක නිසා මේක මම ගත්තේ ස්පර්ශය ගැන කියන්නයි.


මේක හොඳට තේරුම් ගන්න. මේක උදාහරණයක්. **චක්ඛායතන පච්චයා ඵස්සො** කියන එකයි මේ කියන්න යන්නේ.




මේ රූපය වදින්න ඕනෑ චක්ඛායතනයේ. මේ රූපයේ තිබෙන වර්ණය ගන්න පුළුවන් කම තිබෙන්නේ චක්ඛායතනයට පමණයි. චක්ඛායතනය කියන එක පෙර කරන ලද කර්මයක විපාකයක් වශයෙන් අපේ ශරීරයේ හැදිලා තිබෙන එකක්. නමුත් චක්ඛායතනයත් රූපයත් කියන දෙක ස්පර්ශ වෙන්නේ නෑ තනියම. ඒකට හේතුව **ස්පර්ශය** කියන එක **‘රූපයක්’** නොවෙයි. මල තිබුණාට ඇස තිබුණාට ඒ දෙක ස්පර්ශ වෙන්නේ නෑ. මේ රූප වලට එහෙම ස්පර්ශ වෙන්න බෑ. අපි කිව්වට අඹගෙඩි ඇපල්ගෙඩි ලී දඬු ඔක්කොම එකට හැප්පෙනවා කියලා ඇත්තටම ඒ හැප්පිලා නොවෙයි, ඒවා එකිනෙකට ළඟින් ගෑවිලා තිබෙනවා, එච්චරයි. ඒවායේ **ස්පර්ශ ගතිය නෑ**. ඒකට හේතුව, **ස්පර්ශය** තිබෙන්නේ ‘මනෝමය ධර්මයක්’ හැටියටයි, හිතේ තිබෙන චෛතසිකයක් හැටියටයි. ඒක නිසා මේ රූප හැප්පෙන්නේ නෑ. සිතේ පහළවෙන ඵස්ස - වේදනා - සංඥා - චේතනා - ඒකග්ගතා - ජීවිතින්ද්‍රිය - මනසිකාරය කියන ධර්ම සමුදාය අතරින් එකක් තමයි **‘ඵස්සය’**. මේ ඵස්සය (ස්පර්ශය) මලට අයිති එකකුත් නොවෙයි, චක්ඛු ආයතනයට අයිති එකකුත් නොවෙයි. මේ ස්පර්ශය කියන ධර්මයට ආවේනික වැඩක් තිබෙනවා.




මේ සිතට කියනවා විඤ්ඤාණය කියලා. දැන් මේ විඤ්ඤාණයට රූපය දැන ගැනීමට අවශ්‍යයි. ඒ විඤ්ඤාණයට රූපය දැන ගැනීමට නම් ඇස හරහාම යායුතුයි. විඤ්ඤාණයට ඇස මග හැර යන්න බෑ.




විඤ්ඤාණය සංඥාව වේදනාව ඇතුළු ධර්මයන්ට තනියම රූපයට යන්න බෑ. විඤ්ඤාණයට රූපය දැන ගැනීමට නම් ඇස හරහාම යායුතුයි. ඒක නිසා විඤ්ඤාණය ඇතුළු අනෙකුත් චෛතසික ටික ඇදගෙන ගිහිල්ලා රූපයත් සමග චක්ඛු ආයතනයේදී එක්කාසු කරලා දෙන **එක ධර්මයක් තිබෙනවා.** ඒ ධර්මය තමයි **ස්පර්ශය.** එතකොට මේ විඤ්ඤාණයයි රූපයයි එක්කාසු කරලා දෙන ක්‍රියාකාරී ගතියට තමයි කියන්නේ **'ස්පර්ශය'** කියලා, වෙන මොකක්වත් නොවෙයි. ස්පර්ශයේ ස්වභාවය තමයි නාම ධර්ම ටික රූපය සමග සම්බන්ධ කිරීම, එක්කාසු කිරීම, coordinator වැඩේ කිරීම. මේ ක්‍රියාව චක්ඛායතනයේදී සිද්ධවෙන නිසා කියනවා **චක්ඛු සපර්ශය** කියලා.

නමුත් චක්ඛු ආයතනයේ ස්පර්ශය නෑ. රූපයේත් සපර්ශය නෑ. ඒ සියල්ල, එනම් නාම ධර්මත් ඇසත් රූපයත් එකට සම්බන්ධ කරන ගතියට තමයි **ස්පර්ශය** කියලා කියන්නේ. මේ අවස්ථාවේදී මේ ස්පර්ශයට ස්පර්ශ කරගන්න ඕනෑ මලයි. ඒ මල ස්පර්ශ කර ගැනීමට **ඵස්සය** අනිවාර්යෙන්ම ඇස හරහා යායුතුයි. නමුත් ඇසයි නාම ධර්ම සමූහයයි පමණක් එකතු වෙන්නෙත් නෑ, රූපය නැතුව. ඒකෙ තේරුමක් නෑ. ඒක නිසා මේ ඇසේ තිබෙනවා ගතියක් ස්පර්ශයට එතැනට ඇවිල්ලා රූපය සමග ගැටෙන්න පුළුවන්. ඒකට සුදුසු පදනම චක්ඛු ආයතනයේ තිබෙනවා. ඒක නිසා තමයි කියන්නේ **චක්ඛායතන පච්චයා ඵස්සො** කියලා. චක්ඛායතනය තිබෙන නිසා තමයි ස්පර්ශයට මේ විදියට එන්න පුළුවන් කම තිබෙන්නේ. මේ ස්පර්ශයට එන්න පුළුවන් හේතුව, ක්‍රියාත්මක වෙන්න පුළුවන් හේතුව, පදනම, කාරණය තමයි ඇස. ඒක නිසා අපි කියනවා **තිණ්ණං සංගති ඵස්සො** කියලා. **'විඤ්ඤාණයත්' 'ඇසත්' 'රූපයත්'** යන තුන්දෙනාගේ එක්කාසුවට තමයි **'සපර්ශය'** කියලා කියන්නේ. මේ චක්ඛු ආයතනය නැත්නම් විඤ්ඤාණයට රූපයට යන්න බෑ, රූපය දැනගන්න බෑ. ඒකනිසා මේ තුන්දෙනාගේ එකතුවටයි **සපර්ශය** කියලා කියන්නේ. ස්පර්ශය කියලා කියන්නේ ක්‍රියාකාරී ස්වභාවයක්, එක්තරා පුංචි චෛතසික වේග ගතියක්.

<u>ප්‍රශ්නය</u> - චක්ඛායතනය කියලා කිව්වහම ඒ ප්‍රසාද රූපය විතරක්ද?

<u>පිළිතුර</u> - ප්‍රසාද රූපය විතරයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඒ මලත් තිබෙන්න ඕනෑ නේද, නැත්නම් නිකම්ම ප්‍රසාද රූපය තිබුණට වැඩක් නැනේද? එතකොට චක්ඛායතනය කියන කොට රූපයත් ගන්නවද?

<u>පිළිතුර</u> - මෙහෙමයි, දැන් මේ නෝනා ඉස්කෝලෙක ඉගෙන ගත්තනේ.



දැන් හොඳට හිතලා බලන්න, ඉගෙන ගැනීම සඳහාත් ඉගැන්වීම සඳහාත් යම් කිසි තැනක් භාවිතා කරනවා. ඒකට කියනවා පාසැල කියලා. පාසැල හරියට ආයතනය වගේ. පාසැලක ඉන්නවා ළමයි සහ ගුරුවරු. ඉගෙන ගැනීම පිණිස ශිෂ්‍යා පාසැලට යා යුතුයි. ඉගැන්වීම පිණිස ගුරුවරයාත් පාසැලට යා යුතුයි. ශිෂ්‍යාගේත් ගුරුවරයාගේත් අධ්‍යාපනික හමුවීම සිද්ධ වෙන්නේ පාසැලේ. ඒක හින්දා කියනවා විද්‍යායතනය කියලා. ඉස්කෝලේ කියලා කියන්නේ අධ්‍යාපන ආයතනයක්. ඒවගේ එකක් තමයි මේ චක්ඛු ආයතනය.

දැන් හිතන්න, ගුරුවරු ටික විතරක් ඇවිල්ලා ඉන්නවා ඉස්කෝලේ. නැත්නම් ගුරුවරු එන්නේ නැතුව ළමයි විතරක් ගිහිල්ලා ඉන්නවා. මොනවා කරන්නද? හරියටම ඉස්කෝලයක් වෙන්න නම් හරියටම විද්‍යායතනයක් වෙන්න නම් ශිෂ්‍යයෝ ටිකත් ඉන්න ඕනැ. ගුරුවරුත් ඉන්න ඕනැ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඇසට රූපය එනකොටම තමයි විඤ්ඤාණය ඇස හරහා එන්නේ, එහෙමද ?

<u>පිළිතුර</u> - දැන් බලන්න මෙහෙම, ගුරුවරු ඇවිල්ලා ඉස්කෝලෙට උදේ හතේ ඉඳන් එකොළහ විතර වෙනකම් ඉන්නවා. ඒ ගුරුවරු උදේට හතට ගිහිල්ලා ළමයි නැති හිස් පන්තියට උගන්වනවා. ගුරුවරු ගියාට පස්සේ ළමයි ටික ඇවිල්ලා වාඩිවෙලා අහගෙන ඉන්නවා. කවදාකවත් එහෙම වෙනවද? නෑ, එහෙම වෙන්නේ නෑ. ඉගැන්වීමක් සිද්ධ වෙන්න නම් ඉස්කෝලේ ඇරලා තිබෙන්නත් ඕනැ. ශිෂ්‍යයෝ ඉන්නත් ඕනැ. ගුරුවරු ඉන්නත් ඕනැ. මේ ඔක්කොම වෙන්න ඕනැ එකම වෙලාවේ.

ඒවගේ තමයි චක්ඛායතනයට එක වෙලාවකට රූපය ඇවිල්ලා තවත් වෙලාවක විඤ්ඤාණය ආවොත් හරි යනවද? නෑ. ඉස්කෝලයට විද්‍යාතනය කියලා කියන්නේ ඒකෙ දීමනාවක් කරන අය ඉන්නවා ගැනුම් කාරයෝ ඉන්නවා. ගුරුවරු අධ්‍යාපනය දෙනවා, ශිෂ්‍යයෝ අධ්‍යාපනය ගන්නවා. අධ්‍යාපනය දෙන පිරිසයි අධ්‍යාපනය ගන්න පිරිසයි කියන දෙගොල්ලම ඉන්න තැනක් තිබෙනවා. එතැනදී තමයි ඕක සිද්ධ වෙන්නේ.

ඒවගේ, මල තමයි object එක. විඤ්ඤාණය තමයි receiver. නමුත් මේ විඤ්ඤාණයට චක්ඛායතනය bypass කරලා යන්න බෑ. විඤ්ඤාණය රූපය දැන ගන්න නම් චක්ඛායතනය හරහාම යායුතුයි. මේක වෙන්නේ එකම වෙලාවේ. නැත්නම් ඉස්සෙල්ලා මල චක්ඛායතනයේ හැප්පිලා යනවා, ඊට පස්සේ විඤ්ඤාණය ඇවිල්ලා තේරුම් ගන්නවා කියලා එහෙම එකක් වෙන්නේ නෑ. ඒවා වෙන්නේ නැති දේවල්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි කියවන පොත්පත් වල සාමාන්‍යයෙන් තිබෙන්නේ රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කියලා. එතකොට අපි හිතුවේ රූපය දැකලා විඳීමක් ඇතිවෙලා ඊට පස්සේ අඳුරගෙන එහෙම යනවා කියලා. එතකොට අර තුන්දෙනාම එකට එන සිරිතක් නැනේද?


<u>පිළිතුර</u> - පොතේ තිබෙන විදියට අපි චිත්ත රූප හදාගෙන ඉන්නේ. දැන් කණ්ණාඩිය ගැන හිතලා බලන්න. කණ්ණාඩියෙන් අපේ රූපය පේනවා. කණ්ණාඩියෙන් අපේ රූපය පේන්නේ මොන වේලාවේද? රෑටද උදේටද දවාලටද හැන්දෑවටද දෙකටද තුනට ද හතරටද? මොන වෙලාවේ හරි කණ්ණාඩිය ඉස්සරහට ගිය වෙලාවටයි අපේ රූපය කණ්ණාඩියෙන් පේන්නෙ. අපේ රූපය කණ්ණාඩියෙන් පේනවා කියන කියමන හරි, නමුත් හැම වෙලේම පේන්නෙ නෑ.

දැන් හිතලා බලන්න. අපි කණ්ණාඩිය ඉස්සරහට ගියහමද අපේ රූපය කණ්ණාඩියේ වැටෙන්නේ නැත්නම් එතැනින් අයින් උනාට පස්සෙද කණ්ණාඩියට රූපය වැටෙන්නේ? අපි කණ්ණාඩිය ඉස්සරහට යනකොටමයි රූපය කණ්ණාඩියේ වැටෙන්නේ. අපි එතැනින් ඉවත් වෙනකොට කණ්ණාඩියේ රූපය නැතිවෙනවා. ඒවගේ තමයි විඤ්ඤාණයත් ඇසත් රූපයත් යන තුන්දෙනාගේ එක්කාසුව එකම වෙලාවේ සිද්ධ වෙන්නේ. විග්‍රහ කරනකොට අපි කියනවා කණ්ණාඩියේ අපේ රූපය පේනවා කියලා. මට කියන්න පුළුවන් 'අපේ ගෙදර කණ්ණාඩියක් තිබෙනවා, මම ඒකෙන් බලාගෙන උදේ කොන්ඩේ පීරගෙන ආවේ' කියලා. ඕක අහගෙන හිටපු මනුස්සයෙක් යනවා කණ්ණාඩිය තිබුණ ගෙදරට ඒ කොන්ඩේ පීරපු එක කණ්ණාඩියෙ තිබෙනවද කියලා බලන්න. නමුත් එහෙම වෙන්නේ නෑ. ආන්න ඒ වගේ තමයි මේ සිදුවීමත්.

තවත් එකක් කියලා දෙන්නම්. මේක ඕලාරික උපමාවක්. Fair කියලා කියනවා පොළට. ඒකෙ තමයි වෙළඳාම් කරන අයයි ගැනුම්කරුවනුයි දෙගොල්ලොම ඉන්නේ. ඒවගේ විඤ්ඤාණයයි අනිත් චෛතසික ධර්මයි රූපයයි මුණ ගැසෙන තැන තමයි චක්ඛායතනය. ඇසත් රූපයත් විඤ්ඤාණයත් එකට වැඩ කරන තැන නිසා ඒකට කියනවා චක්ඛු ආයතනය කියලා.


**චක්ඛායතන පච්චයා ඵස්සො** = මේ චක්ඛායතනය තිබුණොත් තමයි ස්පර්ශයට රූපය හප්පලා විඤ්ඤාණයට මුණ ගස්සලා දෙන්න පුළුවන් කම තිබෙන්නේ. නැත්නම් බෑ.

අනිත් එක තමයි **සෝතායතන පච්චයා ඵස්සෝ.**




මේ අවස්ථාවේදී විඤ්ඤාණයට සද්දය පැත්තට කෙලින්ම යන්න බෑ. විඤ්ඤාණයට මේ සද්දය අහුලගන්න නම් මේ සද්දය බාරගන්න නම් සද්දය දැනගන්න නම් සෝතයට එන්න ඕනෑ. සෝතයෙන් තමයි සද්දය වද්දාගන්නේ. සද්දය සෝතයට එනවා, විඤ්ඤාණය සහ අනිකුත් චෛතසික සෝතයට යනවා. තුන්ගොල්ලා එක්කාසු වෙනවා. ඒකට කියනවා ස්පර්ශ වෙනවා කියලා. මේ ස්පර්ශයේ තිබෙන වැඩේ තමයි විඤ්ඤාණයයි අනිත් චෛතසික ටිකට ශබ්දය මුණ ගස්සලා දෙන එක. ඒ ක්‍රියාකාරී ස්වභාවය තමයි **ස්පර්ශය** කියලා කියන්නේ.

ඊළඟට ගන්ධය දැනගන්න නම් විඤ්ඤාණය නාසය හරහා යා යුතුයි.




**සුවඳ** කියන එකයි **ආයතනය** කියන එකයි **විඤ්ඤාණය** කියන එකයි තුන්දෙනාම එකතුවෙන තැනට කියනවා **ඝාණායතනය** කියලා.

ඒවගේම තමයි ජිව්හායතනයත්. මේ ආයතන වලට ඕලාරික විදියට කියනවානම් කෙලෙස් හදන තැන කියලා කියන්න පුළුවන්. නමුත් මේවා ඇත්තටම විපාක විඤ්ඤාණ. විපාක විඤ්ඤාණ වලින් එකසැරේටම කෙලෙස් හැදෙන්නේ නෑ. තව ටිකක් ඉස්සරහට හිතාගෙන හිතාගෙන ගියහම මනසේ තමයි කෙලෙස් හැදෙන්නේ. මෙතැන තිබෙන්නේ රූපයක් එක්කාසු කරගන්න, බාර ගන්න ගතිය පමණයි. ඒක නිසා හැම වේලාවේම අපි මේ ධර්මයන් මොන වේලාවේද ක්‍රියාත්මක වෙන්නේ, මොන වේලාවේද ඕක භාර ගැනෙන්නේ, මොන වේලාවේද ඕක වැඩ කරන්නේ කියලා ආයතනය සම්බන්ධ කරලා මනසිකාරයක් කරන්න ඕනෑ. ආන්න එතකොට තමයි ඕක අපිට නිවැරදිව තේරෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි කියන්නේ ඇසට පේන්නෙ වර්ණය පමණයි object එක පේන්නේ නෑ කියලා නේද? ඒක පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න.

<u>පිළිතුර</u> - ඇත්තටම වර්ණය විතරයි පේන්නෙ. චක්ඛු විඤ්ඤාණයෙන් කෙරෙන්නේ පාට ග්‍රහණය පමණයි. චක්ඛු විඤ්ඤාණය වැඩ කරන තැන වෙන මොකක්වත් ගන්නේ නෑ. හිතන ඒවා එන්නේ ඊට පස්සේ. 'හැඩ වැඩ' 'උස මහත' හිතන්නේ පස්සේ මනසින්. ඒවා මනායතනයේ වැඩ කරන ඒවා.

දැන් මේක හොඳට තේරුම් ගන්න.

අපි හිතමු චක්ඛු විඤ්ඤාණය පහළ වෙනවා කියලා. චක්ඛු විඤ්ඤාණය සමඟ පහළ වෙනවා චෛතසික 7ක්.

1.ඵස්ස
2. වේදනා
3.සංඥා
4.චේතනා
5.එකග්ගතා
6.ජීවිතින්ද්‍රිය
7. මනසිකාර

චක්ඛු විඤ්ඤාණයත් සමග මෙතැන තිබෙනවා ධර්මතා අටක්. විඤ්ඤාණය ඇතුලේ වැඩ කරන ධර්ම තිබෙනවා 7ක්. කවදාකවත් වැඩක් නැතුව මේ චෛතසික පහළ වෙන්නේ නෑ. වේදනා චෛතසික තිබෙන්නේ වේදනාවක් විඳින්නයි. ඵස්සය තිබෙන්නේ ඒ වෙලාවට ස්පර්ශ වැඩේ කරන්න. සංඥාව තිබෙන්නේ චක්ඛු විඤ්ඤාණය පහළ වෙන වෙලාවේ සංඥා කරගන්න, පස්සේ සංඥා කරන්න නොවෙයි. ඒක නිසා චක්ඛු විඤ්ඤාණය සහ චෛතසික 7 කියන්නේ එකට පහළවෙන නාම ධර්ම පොකුරක්. මේ නාම ධර්ම පොකුර එකතැනක වැඩ කරනවා.

දැන් හොඳට හිතන්න.


චක්ඛු විඤ්ඤාණය

+

1.ඵස්ස
2. වේදනා
3.සංඥා
4.චේතනා
5.ඒකග්ගතා
6.ජීවිතින්ද්‍රිය
7. මනසිකාර

මේ ධර්ම රංචුවේ වේදනාව තිබෙනවා. නමුත් වේදනාවට යන්න බෑ. සංඥාව තිබෙනවා. සංඥාවට හඳුනා ගන්න පුළුවන්, දැන ගන්න පුළුවන්, සටහන් කරගන්න පුළුවන්, නමුත් යාගන්න බෑ. චේතනාව තිබෙනවා, ඒකට හිතන්න පුළුවන්, මෙහෙය වන්න පුළුවන්, නමුත් යාගන්න බෑ. ඒකග්ගතාවය තිබෙනවා, ඒකට යොමුකරගන්න පුළුවන් නමුත් යාගන්න බෑ. ජීවිත ඉන්ද්‍රියත් මනසිකාරයත් ඒවගේ. ඒක නිසා වැඩ අටක් කරන අට දෙනෙක් ඉන්නේ මෙතැන. විඤ්ඤාණය කරන්නේ object එක දැන ගන්න එක පමණයි. නමුත් මේ ඔක්කොම ටික පහළ වෙන්නේ එක රංචුවට, එක පොදියට. මේවා නොසලකා අපි කියනවා චක්ඛු විඤ්ඤාණය පහළ වෙනවා කියලා. නමුත් චක්ඛු විඤ්ඤාණය මේ චෛතසික නැතුව පහළ වෙන්නේ නෑ.

ඉස්සෙල්ලා චක්ඛු විඤ්ඤාණය පහළ වෙලා පස්සේ වේදනාව පහළ වෙලා වැඩක් නෑ, එහෙම වෙන්නෙත් නෑ. දැන් මේ නාම ධර්ම පොකුරම පහළ වෙලා වැඩ කරන ආයතනය වෙන්නේ චක්ඛායතනය. ඒක පහළ වෙන මොහොතේ මේ 8 දෙනා වැඩ 8ක් කරලා තිබෙනවා නමුත් අපිට ඒක තේරෙන්නේ නෑ. මේ 8 දෙනා එක තැනකට ගිහිල්ලා බැහැලා වැඩක් කරලා තිබෙනවා නමුත් අපිට එහෙම පුංචි පුංචි ඒවා බෙදා ගන්න හයියක් ගැම්මක් නෑ.



මේ ධර්මතා අට ඇසේ පහළ උනාට, ඒ අට දෙනාගේ office එක චක්ඛුව උනාට ඒ ගොල්ලෝ කරන්නේ වෙන වැඩක්. ඒ අය කරන්නේ මොකක් හරි රූපයක් බලන එකයි. ඒ රූපයට අපි මලක් කියලා කිව්වට මේ චක්ඛු විඤ්ඤාණයෙන් මලේ තිබෙන ඔක්කෝම දේවල් ගැන හිතන්නේ නෑ. චක්ඛු විඤ්ඤාණයෙන් කරන්නේ මලේ තිබෙන පාට දැනගන්න එක පමණයි. ඒකට කියනවා වර්ණය දැන ගන්නා වූ ගතිය කියලා. චක්ඛු විඤ්ඤාණයට කරන්න පුළුවන්කම තිබෙන්නේ ඇස හරහා ගිහිල්ලා රූපයේ තිබෙන වර්ණය දැන ගන්න එක පමණයි.

ඊළඟට සංඥාව. මේ සංඥාව කියන එක අමුතු දෙයක් කරනවා. රූපයක් ගත්තහම උසක් තිබෙනවා. මහත ගතියක් තිබෙනවා. වර්ණයක් තිබෙනවා. තවත් ඒ මල අවට නොයෙකුත් දේ තිබෙන්න පුළුවන්. නමුත් මේ වේලාවේ මෙයා බලන්නේ මල දෙස පමණයි. මේ වෙලාවට මේ සංඥාව කියන එකට පුළුවන් මල අවට තිබෙන්නා වූ සියලුම අනෙකුත් දේවල් තෝරලා අයින් කරලා මලේ තිබෙන හැඩය ගැනත් උස ගැන හිතන්නේ නැතුව, මහත ගතිය ගැනත් හිතන්නේ නැතුව, තද ගතිය හිතන්නේ නැතුව මලේ තිබෙන පාට පමණක්ම තෝරාගන්න පුළුවන් ගතියක් තිබෙනවා මේ සංඥාවට. මල අවට තිබෙන්නා වූ අනිත් objects අනිත් සටහන් හිතන්නේ නැතුව ඒ අරමුණේ තිබෙන පාට පමණක්ම තෝරාගෙන උලුප්පවලා ගන්න ගතිය තිබෙන හින්දා තමයි මේ චක්ඛු විඤ්ඤාණයට අරමුණේ පාට බලාගන්න පුළුවන් කම තිබෙන්නේ. සංඥාව කියන එක මේ විදියට තේරුම් ගන්න. සංඥාව කියලා කියන්නේ එක දෙයක් උලුප්පවලා දෙන ගතිය. චක්ඛුවිඤ්ඤාණය සමග පහළ වෙන සංඥාව අරමුණේ තිබෙන පාට විතරක් ග්‍රහණය කරලා ගන්න හින්දා තමයි චක්ඛුවිඤ්ඤාණයට ඒ ටික පමණක් තේරුම් ගන්න පුළුවන් කම තිබෙන්නේ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස ඇස් දෙකක් තිබෙන නිසා ආයතන දෙකක් කියලා ගන්නවාද?

<u>පිළිතුර</u> - නෑ, ඇස් දෙකක් තිබුණට ඒකෙන් objects දෙකක් බලන්නේ නෑ. චක්ඛු විඤ්ඤාණය focus කරන්නේ එක අරමුණයි.

<u>ප්‍රශ්නය</u> - එතකොට ස්වාමීන්වහන්ස ආලෝකය?

<u>පිළිතුර</u> - ආලෝකය බාහිර එකක්. වර්ණය ග්‍රහණය කරන්න පුළුවන්කම තිබෙන්නේ ආලෝකයක් object එකට වැටුනොත් පමණයි.

මේ **සංඥාව** කියන එක ක්‍රියාත්මක කරලා හොඳට බලන්න. මේ වටපිටාවේ ගොඩක් දේවල් තිබෙනවා. දැන් මම කෝප්පේ දිහා බලනවා කියලා කියනවා. මේ කෝප්පේ කහ පාටයි. කහ පාට පමණයි ග්‍රහණය කර ගන්නේ. තවත් මේ අවට සුදුපාට දේවල් තිබෙනවා, බෝතලයක් තිබෙනවා. මේ කෝප්පේ රවුමක් තිබෙනවා, උසක් තිබෙනවා තවත් බොහෝ දේ තිබෙනවා. ඕවා ගැන හිතන්න ගියොත් එහෙම මේ පාට කියන එක තේරුම් ගන්න බෑ. හැම වේලාවේම අපේ චක්ඛු විඤ්ඤාණයට ග්‍රහණය කරලා දෙන්නේ උස මහත හැඩ ආදී දේ නොවෙයි, වර්ණය පමණයි. ආන්න ඒ වැඩේ කරන්න පුළුවන්කම තිබෙන්නේ එතැන උපදින සංඥාවේ ආනුභාවයෙන්. සංඥාව කරන්නේ අනිත් හැඩ වැඩ ඔක්කෝම මේ වෙලාවට එපා කියලා පාට විතරක් උලුප්පවලා තෝරවලා බේරවලා දෙනවා. මේ සංඥාව කියන එක චක්ඛු විඤ්ඤාණයට බද්ධ වෙලා තිබෙන නිසා තමයි එක එක ඒවා වෙන වෙනම තෝරාගන්න පුළුවන් කම තිබෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතකොට අනිත් ප්‍රකිර්ණක චෛතසික 6?

<u>පිළිතුර</u> - මෙතැන ඒවා නෑ. මේ චක්ඛු විඤ්ඤාණය විපාක සිතක්. මේ සිත පහළ උනාට පස්සේ ගිහිල්ලා වදිනවා හිත ඇතුලේ. හිත ඇතුලේ වැදුනට පස්සේ ඒ ගැන වැඩ කරන්න හිත ඇතුලේ වෙනම වැඩ සටහනක් තිබෙනවා. ඒ මනායතන සහ ධම්මායතනය.

- ආයතන හයක් තිබෙනවා. ඒ ආයතන හයෙන් වැඩ හයක් කරනවා. චක්ඛු විඤ්ඤාණය පහළ වෙලා වැඩි වේලාවක් තිබෙන්නේ නෑ. ඒක පාටක් ග්‍රහණය කරලා එහෙම්ම නැති වෙනවා. ඒක නැතිවෙච්ච ගමන්ම ඒ චක්ඛු විඤ්ඤාණයෙන් ගත්තු පාට ගිහිල්ලා වදිනවා මනායතනයේ. එතකොට ඒ වෙලාවට ඇහැ ඇරලා රූපය බලන්න වගේ මනායතනයට ඒක පේනවා. චක්ඛු විඤ්ඤාණයෙන් ගත්තු රූපය ඇතුලට වැදුනට පස්සේ අපිට තේරෙන්නේ තවම ඇහැ ඇරගෙන බලනවා වගේ. එතකොට ඉස්සෙල්ලා චක්ඛු විඤ්ඤාණයෙන් අරගෙන දීපු වර්ණ ඡායාව මනසේ කාවද්දගෙන මනායතනය වෙන ගනුදෙනුවක් කරනවා. එතකොට තමයි ඔය ප්‍රකීර්ණක වගේ චෛතසික එන්නේ. ඕක ඔහොම ඇතුලට ගිහිල්ලා හිත හිතා පස්සේ ඒක හොඳ එකක් නම් ඇස දෙක පියාගෙන වැඩියෙන් වැඩියෙන් හිතනවා. හිත හිතා සංස්කරණය කරනවා. ඒකට තමයි කියන්නේ කර්ම හදනවා කියලා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඒකටද 17 ක් වශයෙන් චිත්ත කාණ්ඩ යනවා කියන්නේ?

<u>පිළිතුර</u> - ඔව්, එකක් ඉවර උනහම තව එකක් වශයෙන් චිත්ත පේළි ගිහිල්ලා ඒ අරමුණ හොඳට හිතේ කාවද්දගෙන ඒකට අනුව වැඩ කරනවා.

අපි හිතමු මෙහෙම. දැන් ගෙවල් කිට්ටුව කිට්ටුව තිබෙන නිසා එහා ගෙදරට ගෙනාපු දේවල් මෙහා ගෙදර ජනේලකින් උනත් බලාගන්න පුළුවන්. උදාහරණයක් හැටියට අපි හිතමු ඒ ගෙදරට TV එකක් ගෙනාව කියලා. මෙහා ගෙදර ඉඳලා අපි බලනවා. එතකොට අපි දැක්කේ TV එකක්. අපි ඒක බලලා ඒ අයට පෙනෙයි කියලා මුවා වෙනවා. දැන් ඒ අය ඇවිල්ලා ඒ පෙට්ටිය අරිනවා. අපි ඒකත් ගිහිල්ලා බලලා නැවතත් මුවා එනවා. ඊට පස්සේ ඒගොල්ලෝ ඒක කොහේ හරි තැනක තබනවා. අපි ඒකත් බලනවා. ඔය විදියට අපි ඒක දිහා බල බලා ඒ අය ඒක ගත්තු ආකාරය ගැන හිතනවා. 'ඒ අය ණයක් අරගෙන වෙන්න ඇති ඒක ගන්න ඇත්තේ' කියලා හිතනවා. මේ වගේ අපි ඒ පැත්ත බලනවා, ඊළඟට හිතනවා, ඒ ගැන කරුණු හදනවා. ඒකට කියනවා සංස්කරණය කරනවා කියලා. ඒක හිතේ වද්දාගෙන ඒගැන හිතනවා. මේක නැවත නැවත කරනවා. මේ තුලින් අපි කර්ම හදනවා.

අපි නැවත වාරයක් ඒ පැත්ත බලනවා. එතකොට අපිට පේනවා ඒ අය ඒකේ ක්‍රිකට් බලනවා. ඒකට මම කැමති නෑ. දැන් මගේ මේ අකමැති වීම සිද්ධ වෙන්නේ පස්සේ. ඉස්සෙල්ලා කළේ ඒ පැත්ත බල බල ඒක හිතේ වද්දා ගන්න එක. අකමැති වීම් වශයෙන් කර්ම රැස්කරන්නේ පස්සේ.

ඔය වගේ තමයි මේ චක්ඛු විඤ්ඤාණය. චක්ඛු විඤ්ඤාණය කියන එක කරන්නේ රූප ග්‍රහණය කිරීම. ඊට පස්සේ ඇතුලට අරගෙන මනෝමය වශයෙන් වෙන වැඩ සටහනක් කරන්නේ. හැම එකේම එහමයි. සද්දයක් අහනවා, ඊළඟට ඇතුලට ගිහිල්ලා ඒක ධම්මායතනය හැටියට අරගෙන මනෝමය වශයෙන් හිත හිතා උපදවනවා.

චක්ඛු විඤ්ඤාණයේ තිබෙන්නේ රූප සංඥාවක්. ඇතුලට ගියහම ඒ රූප සංඥාව ධර්ම සංඥාවක් වෙනවා. ඒ කියන්නේ ඉස්සෙල්ලා ගත්තු එකක අනුරූපයක් තිබෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස 'කෝප්පය' කියන එක පොඩි ළමයෙක් දන්නේ නෑ. නමුත් අපි දන්නවා. අපිට ඒ හුරුව කොහොම ආපු එකක්ද? මනායතනයේ රැස් වෙච්ච එකක්ද?

<u>පිළිතුර</u> - ඒක එකපාරම ආපු එකක් නොවෙයි. අපේ මනායතනයට සම්පූර්ණයෙන්ම කෝප්පයක් කියලා දැන ගන්න ගොඩක් වෙලා යනවා. පොඩි කාලේදී අපි ඒක දන්නේ object එකක් වශයෙන්. අම්ම කිරි හරි තේ හරි පොවන්න ගත්තු object එකක් හැටියට. ඊට පස්සේ ඒක කටට ළං කරනකොට අපි දන්නවා මේක අපිට මොනවා හරි පොවන්න පාවිච්චි කරන එකක් කියලා. එතකොට අපි ඒකෙ පාට දන්නවා ඒකෙ size එක දන්නවා. නමුත් නම දන්නේ නෑ. පස්සේ තමයි දන්නේ ඒකට 'කෝප්පය' කියනවා කියලා. ඒක එක පාරම වෙන්නේ නෑ. ටික ටික තමයි ඕක වෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන් වහන්ස රූප බලන අවස්ථාවේ ස්පර්ශය ඒකට අයිති වැඩේ කරන මොහොතේම සංඥාවත් ක්‍රියාත්මක වෙනවද? එතකොට අනිත් ධර්මවලත් ඒ වේලාවේදීම කරන කාර්යන් තිබෙනවාද?

<u>පිළිතුර</u> - ඔව් තියෙනවා, චක්ඛු විඤ්ඤාණය - ඵස්ස - වේදනා - සංඥා - චේතනා - ඒකග්ගතා - ජීවිතින්ද්‍රිය මනසිකාරය කියන අට දෙනා එකම වෙලාවේ වැඩ අටක් කරනවා.

<u>ප්‍රශ්නය</u> - මනසිකාරයෙන් සහ වේදනාවෙන් මොකක්ද කරන්නේ?

<u>පිළිතුර</u> - මනසිකාරයෙන් කරන්නේ අරමුණට යොමු කරන එක. වේදනාව කරන්නේ විඳින එක.

ඔය අට දෙනා වැඩ අටක් කරලා යනවා. නමුත් අපිට තේරෙන්නේ එකක් පමණයි. අපිට තේරෙන්නේ විඤ්ඤාණයේ වැඩේ විතරයි. හේතුව, අනිත් ඒවා නිකං සිහින වගේ. ඒ තරමටම සියුම්. ඵස්ස - වේදනා - සංඥා - චේතනා - ඒකග්ගතා - ජීවිතින්ද්‍රිය - මනසිකාරය කියන චෛතසික 7 වැඩ හතක් කරාට අපිට ප්‍රකටව තේරෙන්නේ නැත්තේ ඒවායේ තිබෙන සියුම් භාවය නිසයි. නැත්නම් හොඳට හිතලා බලන්න, වේදනාව සංඥාව ආදී මේ චෛතසික වලට කරන්න වැඩක් නැත්නම් ඇයි ඒවා පහළ වෙන්නේ? ඒවා පහළ වෙන්නේම ඒවාට අදාළ කෘත්‍ය ස්වභාවයක් එතැනට යොමුවෙන නිසාමයි. අර ලංකාවේ කථාවක් තිබෙනවා, 'ඇයි මේ පැත්තේ' කියලා ඇහුවහම 'නිකංආව' කියලා කියනවා. ඒ උනාට මේ චෛතසික එහෙම නෑ, චෛතසික නිකං පහළ වෙන්නේ නෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දැන් සංඥාවෙන් වෙන්නේ වර්ණය පමණක් හඳුනා ගැනීම, එතකොට ඒ කෝප්පේ හැඩය වගේ දෙවල් හඳුනා ගන්නනෙත් සංඥාවෙන්ද?

<u>පිළිතුර</u> - නෑ, 'හැඩ' හඳුනාගන්න වෙනම හිතන්න ඕනෑ ඇතුලට ගිහිල්ලා. කවදාවත් හැඩය ඇසට පේන්නෙ නෑ. 'උස' කියන එක පේන්නේ නෑ. 'උස' කියන එක අපි පේනවා කියලා කිව්වට අපිට පේන්නේ එක්තරා ප්‍රමාණයකට පාටක් විතරයි. අපි ඇතුලෙන් හිතා ගන්නවා ඒක තමයි උස කියලා. ඒක මනෝමය ධර්ම සංඥාවක්. අපිට පේන්නෙ පාට විතරයි.

<u>ප්‍රශ්නය</u> - එතකොට ස්වාමීන්වහන්ස මුලින් අපි දකිනේ වර්ණය. එතකොට 'උස' වගේ අනිත් ඒවා මොන අවස්ථාවලදීද දැන ගන්නේ?

<u>පිළිතුර</u> - කෝප්පයක් දිහා බැලුවට පස්සේ වේගවත් චිත්ත පේළියක් යනවා. ඒක දිහා බැලුව ගමන්ම පාට පේනවා. ඒ එක්කම ඒක ඇතුලේ වැදීගෙන යනවා. එතකොට උස වගේ දේවල් හිතාගෙන හිතාගෙන යනවා. දැන් මේ අපි කථා කරන්නේ ඉස්සේල්ලාම වදින තැන ගැන. අපි ඉස්සෙල්ලාම කෝප්පය දිහා බලලා පාට වද්දගත්තට පස්සේ අපි කෝප්පය පැත්තට ඇස හරවාගෙන හිටියත් අපි තව දුරටත් කෝප්පය දෙස බලන්නේ නෑ. අපි හිතන්නේ අපි කෝප්පේ දිහා දිගටම බලාගෙන ඉන්නවා කියලා. නමුත් එහෙම එකක් වෙන්නේ නෑ. කෝප්පය දෙසට ඇස් හරවාගෙන හිටියට ඒ වේලාවට චක්ඛු විඤ්ඤාණය නොවෙයි වැඩ කරන්නේ, ඇතුලත හිත වැඩ කරන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස චක්ඛුවිඤ්ඤාණය සමග පහළ වෙන චේතනාවේ ක්‍රියාව පිළිබද උදාහරණයක් දෙන්න.

<u>පිළිතුර</u> - චේතනාව කියන එකේ වැඩ කටයුතු දෙකක් තිබෙනවා. ඒ දෙකෙන් එක වැඩක් තමයි කර්ම හදන එක. අනිත් එක තමයි චේතනාව සමග සිටින අනිත් ධර්ම සියල්ලම lead කරන එක. මේ දැන් අපි කථාකරන චක්ඛු විඤ්ඤාණයේ දී චේතනාව කරන්නේ අනිත් චෛතසික ටිකයි සිතයි මල පැත්තට lead කරන එක. කර්ම සකස් කිරීම කියන්නේ වෙන එකක්. මේ වෙලාවේදී කර්ම හදන්නේ නෑ. කර්ම හදන්නේ වෙනත් මනෝමය වශයෙන් කරන ක්‍රියාවලදී. එතැනදී චේතනාව වැඩ දෙකක් කරනවා. එකක් තමයි කර්ම හැදීම අනිත් එක තමයි චේතනාව සමග සිටින අනිත් නාම ධර්ම lead කිරීම.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතකොට සම්පටිච්ඡන සන්තීරණ සිත් ඇති වෙන්නේ මනසිකාර කරනකොටද?

<u>පිළිතුර</u> - ඔව් සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන ආදී සිත් ඇතිවෙන්නේ මනෝ වශයෙන්. චක්ඛු විඤ්ඤාණයෙන් ගත්තු ඒවා මනසින් අරගෙන පහළ වෙන සිත් තමයි ඒ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන් වහන්ස මෙතැනින් නවත්වන එකද 'දිට්ඨෙ දිට්ඨමත්තං' කියලා කියන්නේ?

<u>පිළිතුර</u> - නෑ, චිත්ත වීථී යන ඒවා එහෙම නවත්වන්න බෑ. ඒවා චිත්ත නියාමයට අනුව වේගයෙන් පහළ වෙනවා.

අරමුණක් සම්බධයෙන් චිත්ත වීථී 5ක් යනවා.

1) පළවෙනි චිත්ත වීථියෙන් රූපය දැන ගන්නවා. [මේක අමු (raw) රූපය ගත්තු චිත්ත වීථිය]

2) දෙවෙනි චිත්ත වීථිය පළවෙනි වීථියෙන් ගත්තු අරමුණම අරගෙන මනසේ පහළ වෙනවා. මේකත් පළවෙනි එක වගේමයි පේන්නෙ. නමුත් මේ වෙලාව වෙනකොට ඇසෙන් අයින්වෙලා. මේක පළවෙනි එකේ පිටපතක් = (replica)

3) තුන්වෙනි චිත්ත වීථියෙන් ඒ ගත්තු අරමුණ ගැන හිතනවා.

4) හතර වෙනි චිත්ත වීථියෙන් ඒ අරමුණට කියන නම තේරුම් ගන්නවා.

5) පස්වෙනි චිත්ත වීථියට එනකොට කෙලෙස් ඇතිවෙනවා. මෙන්න මෙතැනදී තමයි පරෙස්සම් වෙන්න ඕනෑ. මුල් වීථිවලදී මුකුත් කරන්න බෑ. පස් වෙනි වීථියට එනකොට ගත්තු අරමුණ හොඳට හිතේ කා වැදිලා තිබෙන්නේ. එතැනදී හොඳට ඒ ගැන හිතන්න යනවා. එතකොට කෙලෙස් හැදෙනවා.

මේ තිබෙන්නේ චිත්ත වීථි විශ්‍රයක් පමණයි. මේක තමයි සිද්ධ වෙන mechanism එක. මේ mechanism එක ගැන හිත හිතා මිනිස්සු භාවනා කරන්න යන්නේ නෑ.

ඒක නිසා අපිට ප්‍රායෝගිකව කරන්න තිබෙන්නේ යම්කිසි දෙයක් දැක්කහම 'ඒ ගැන වැඩිය හිතන්න හොඳ නෑ' කියලා අතහරින එක. ඒවගේම යම්කිසි දෙයක් ඇහුනහම 'ඒ ගැන වැඩිය හිතන්න හොඳ නෑ' කියලා අතහරින එක. නමුත් මේවා ධර්ම වශයෙන් දැනගෙන ඉන්න එක හොඳයි. අපි උනත් භාවනා කරන්න හියහම මේවා ගැන හිතන්නේ නෑ. නමුත් අපි දන්නවා මේක තමයි mechanism එක කියලා. මේ විදියට තමයි මේක වැඩ කරන්නේ කියලා ධර්ම ස්වභාවය දන්නවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ජීවිත ඉන්ද්‍රිය සහ ඒකග්ගතා කියන චෛතසික වලින් මොකක්ද කරන්නේ?

<u>පිළිතුර</u> - ජීවිතඉන්ද්‍රියෙන් කරන්නේ අනිත් චෛතසික ධර්ම මැරෙන්න දෙන්නේ නැතුව පවත්වන එක. ඒකග්ගතා කියන එක කරන්නේ ඒ නාම ධර්ම රංචුවම විසිරෙන්න නොදී එම අරමුණයෙහි පිහිටවීම.

මේකේ mechanism එක තේරුම් ගත්තහම ආයතන පැහැදිලිව තේරුම් ගන්න පුළුවන්. අද ධර්ම විග්‍රයේ තිබෙන මූලිකම කාරණය තමයි **ඵස්සය** කියන චෛතසිකයේ වගකීම.

ඵස්සය කියන චෛතසිකයට තිබෙනවා වග කීමක්. ස්පර්ශයට තිබෙන වගකීම තමයි තමන් සමග සිටින සියලුම නාම ධර්ම එක්කරගෙන යන්න ඕනෑ චක්ඛු ආයතනය පැත්තට. ඊට පස්සේ ඇස ඉදිරියෙන් තිබෙන මලයි අනෙකුත් නාම ධර්ම ටිකයි චක්ඛායතනයේදී මුණ ගස්සලා දෙන්න ඕනෑ. ඒක තමයි ඵස්සයට අයිති වැඩේ. ඵස්සය අනිත් ධර්ම සමූහය මලේ හප්පවලා දෙනවා. ඒ ක්‍රියාව කරන්නේ ඇසේ ඉඳගෙන. ඒ කටයුත්ත කළාට පස්සේ ඒකට අයිති වැඩේ ඉවරයි. ඵස්ස චෛතසිකයේ සේවාවට අනිත් චිත්ත චෛතසික ධර්ම යටත් වෙනවා. මේ ඵස්ස චෛතසිකයේ මූලිකත්වයෙන් අනිත් ධර්ම වලට වැඩ කරන්න පුළුවන් කම තිබෙන්නේ ආයතනයක් තිබුණොත් විතරයි. නැත්නම් ඵස්සයට වැඩක් කරන්න බෑ. ඒකනිසා තමයි **සළායතන පච්චයා ඵස්සො** කියලා කියන්නේ.

**සළායතන** වෙන වෙනම ගත්තහම **චක්ඛායතන පච්චයා ඵස්සො - සෝතායතන පච්චයා ඵස්සො - ඝාණායතන පච්චයා ඵස්සො - ජිව්හායතන පච්චයා ඵස්සො - කායායතනය පච්චයා ඵස්සො - මනායතන පච්චයා ඵස්සො** කියලා **ඔය විදියටයි තිබෙන්නේ. සළායතන පච්චයා ඵස්සො** කියලා එකට කිව්වට වෙන වෙනම තමයි අපි තේරුම් ගන්න ඕනෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතන ඵස්සය නාම ධර්මයක් හැටියටයි තිබෙන්නේ. සාමාන්‍ය කථාවේදී ස්පර්ශ වෙනවා කියලා වෙන කථාවක් තිබෙනවා. එතකොට ඒ විදියට දෙකක් තිබෙනවාද?

<u>පිළිතුර</u> - අපි සාමාන්‍ය ලෝකයේ හැප්පෙනවා කියලා කියනවා. ඇත්තටම ඒක ලෝක ව්‍යවහාරයක්. වාහනයක් හැපෙනවා කියලා කියනවා. ඇත්ත වශයෙන් ඒක මේ වගේ ස්පර්ශයක් වීමක් නොවෙයි. ඒක ළං වීමක්. අපි පුටු දෙකක් ළඟින් තබනවා. පුටු දෙක ස්පර්ශ උනා කියලා කියන්න පුළුවන්. ඒ උනාට වෙන්නේ පුටු දෙක ළඟින් තිබෙන එක.

<u>ප්‍රශ්නය</u> - එතකොට අපේ ඇඟේ යමක් හැපුනොත් ඒකත් එහෙමද?

<u>පිළිතුර</u> - නෑ, ඒක වෙනයි. ඒක ඵස්සය.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස මෙතැනදී ගැටීමක් වගේ තිබෙන ඉතා සියුම් දෙයක් හඳුන්වන්න **ඵස්සය** කියන වචනය තමයි පාවිච්චි කරලා තිබෙන්නේ. මේක ටිකක් තේරුම් ගන්න අමාරු එකක් කියලා තමයි රේරුකානේ හාමුදුරුවන්ගේ පොතේ තිබෙන්නේ.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඇත්ත වශයෙන්ම ඕක ක්‍රියා ස්වරූපයක්. රූපයයි විඤ්ඤාණයයි එක තැනකදී එක්කාසු වෙනවා. ඒ එක්කාසු වෙන ක්‍රියා ස්වරූපයට තමයි ඵස්ස කියලා කියන්නේ. ඒක අතිශය සූක්ෂම ධර්මයක්. ඒක එක්තරා වේග ස්වභාවයක්.

හොඳයි එහෙනම් සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය සිද්ධ වේවා!ඒවගේම හොඳින් මේ ගාම්භීර ධර්ම කාරණා තේරුම් ගන්න වටහා ගන්න ශක්තිය ලැබේවා! ධර්මක්ඥානය භාවනා ඥානය පහළ වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.